2026.10.07

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමා,
බන්ධනාගාර මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර
කොළඹ 09.

## අධිකරණ තීන්දුවක් ප්‍රකාරව බන්ධනාගාර ගත කෙරුණු ගලගොඩඅත්තේ ඤාණසාර ස්ථවිරයන්ට ගිහි වස්ත්‍ර අන්දවා අධිකරණයට ඉදිරිපත් කිරීම සම්බන්ධවයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා අධිකරණමය ක්‍රියාදාමයන්ට කිසිදු පාර්ශ්වයකින් බාධා නොවිය යුතු බව අපගේ ස්ථාවරයයි. එහෙත් ගලගොඩඅත්තේ ඤාණසාර ස්ථවිරයන් ගිහි වස්ත්‍ර අන්දවා ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට ඊයේ දිනයේ දී බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතු කළ ආකාරය අපගේ විමතියට හා දැඩි කනස්සල්ලට හේතු වන බව අවධාරණය කරනු කැමැත්තෙමු.

භික්ෂුවකගේ චීවරය ඉවත් කිරීම හෝ පැවිදි භාවය අහෝසි කිරීම හුදෙක් රාජ්‍ය පරිපාලනමය හෝ බන්ධනාගාර රෙගුලාසියකට සීමා වූ කරුණක් නොවන අතර එය ගරුතර මහාසංඝරත්නයට අයත් වන ශාසනික කර්තව්‍යයකි. වර්තමාන සන්දර්භය අනුව අදාළ භික්ෂුව අයත් වන නිකාය/පාර්ශ්වයේ ගරුතර කාරක මහාසංඝ සභාව වෙත සංඝ සම්මතයෙන් එවැනි කරුණක් සම්බන්ධයෙන් තීරණය ගැනීමේ බලාධිකාරය පැවරී ඇත. ගලගොඩඅත්තේ ඤාණසාර ස්ථවිරයන් භික්ෂුත්වය ඡේදනය වන පාරාජිකා ආපත්තියකට පත්ව ඇති බවට හෝ චීවරයෙන් නෙරපිය යුතු බවට අදාළ සංඝ සභාව මඟින් කිසිදු තීරණයක් ගෙන නොමැත. එවන් පසුබිමක් තුළ බන්ධනාගාර පරිපාලනය මඟින් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම සමස්ත සම්බුද්ධ ශාසනයේ පැවැත්ම අභියෝගයට ලක් කිරීමට හේතු වන අතරම බෞද්ධ සම්ප්‍රදායට සිදුවන බලවත් හානියකි.

එහෙයින් අධිකරණය මඟින් වරදකරු කරන ලද යම් භික්ෂුවකගේ භික්ෂුත්වයට අදාළ කරුණු සම්බන්ධයෙන් එකී භික්ෂුව අයත් වන නිකාය පාර්ශ්වයේ නිර්දේශ හා නියමයන් පරිදි බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතු කිරීම සුදුසු බව අපගේ විශ්වාසයයි. බන්ධනාගාර නිත්‍ය නියෝග මාලාවේ 550 වන රෙගුලාසියේ දැක්වෙන අන්දමට, "උසාවියට ඉදිරිපත් කළ යුතු වරදකරු කරනු ලැබූ සිරකරුවන් බන්ධනාගාර ඇඳුමින්ම උසාවියට ඉදිරිපත් නොකළ යුතුය. ඒ වෙනුවට වරදකරුවන් කරනු ලැබීමට පෙර ඔවුන් ඇඳීමට පුරුදුව සිටි ඇඳුමට ගැලපෙන සිවිල් ඇඳුමක් ඇඳීමට ඔවුන්ට ඉඩ දිය යුතුය." ඒ අනුව භික්ෂුවක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය ක්‍රියාත්මක කිරීමේදී " වරදකරු වීමට පෙර ඇඳි ඇඳුම" වන්නේ චීවරය විනා ගිහි ඇඳුමක් නොවන බව අපගේ විශ්වාසයි.

තව ද එක්සත් ජාතීන්ගේ සම්මත අවම රීති මාලාවේ 17 (3) වන රීතිය ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන බව අපි විශ්වාස කරමු. එකී රීතිය ප්‍රකාරව "යම් සිරකරුවෙකු බලයලත්/අනුමත කටයුත්තක් සඳහා බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යනු ලබන සෑම අවස්ථාවකදීම, ඔහුට තමාගේම පෞද්ගලික ඇඳුම් හෝ සාමාන්‍ය ඇඳුමක් ඇඳීමට අවසර දිය යුතුය."එබැවින්, ගරු අධිකරණ තීන්දුවට හා බන්ධනාගාර නීතිවලට බාධාවක් නොවන අයුරින්, ගලගොඩඅත්තේ ඤාණසාර ස්ථවිරයන් බන්ධනාගාරය තුළ රැඳී සිටින කාලසීමාව තුළ භික්ෂුත්වයට අගතියක් නොවන අයුරින් කටයුතු කිරීමට අවකාශය සලසා දෙන ලෙසත් ඉදිරි අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමේදී ද අඛණ්ඩව භික්ෂු භාවයෙන් (චීවරධාරීව) පෙනී සිටීමට අවශ්‍ය පරිපාලනමය පහසුකම් සලසා දීම සුදුසු බවත් හිතාධ්‍යාශයෙන් යුතුව සිහිපත් කර සිටිම්හ.

ඒ වගත් මෙසේ ම,

.....................................................
අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර.

.....................................................
අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී
පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර.

.....................................................
අතිපූජ්‍ය කරගොඩඋයන්ගොඩ මෛත්‍රී මූර්ති අභිධාන
ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක
ස්ථවිර, ශ්‍රී ධම්මානන්ද විද්‍යායතන පිරිවෙන,
මීරිස්වත්ත, බළංගොඩ.

.....................................................
අතිපූජ්‍ය මකුලෑවේ ශ්‍රී විමලාභිධාන
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක ස්ථවිර,
මිණිඹළුව විද්‍යාවාස මහ පිරිවෙණ,
මීරිගම.

පිටපත:
ගරු අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ශණ නානායක්කාර මැතිතුමා,- දැනැගනීම හා අවශ්‍ය කටයුතු සඳහා
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.